**ශීර්ෂය 122 - ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

--------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ සැසඳීමක් කළ නොහැක. තවද, එ් හේතුවෙන්ම ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශද මෙම වාර්තාවෙන් ඉදිරිපත් කර නැත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267 / 2018 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| චක්‍රලේඛය ප්‍රකාරව වෙනත් ආදායම් තම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් ලෙස සලකා සටහන් කලයුතු බව දක්වා ඇතත් අමාත්‍යාංශය විසින් එකතු කල රු.19,635,935 ක වෙනත් ආදායම සටහන් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වෙනත් ආදායම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව පෙන්විය යුතු වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හා 2018 නොවැම්බර් 21 දිනැති චක්‍රලේඛය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ මඟ පෙන්වීම යටතේ (ii) උප වගන්තිය ප්‍රකාරව රු.19,635,935 ක මුදල ඒ.සී.ඒ - 3 අකෘතිය යටතේ අක් මුදල් ගැලපීමේ ගිණුම යටතේ ගිණුම් ගතකර ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉහත 1.6.1 හි සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව තැන්පතු ලැබීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමේ දී භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල සඳහන් සංඛ්‍යා පදනම් කරගත යුතුව තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට තැන්පතු ලැබීම් ශේෂ භාණ්ඩාගාර මුද්‍රිතය අනුව රු.633,792 ක් වුවද එම ශේෂය මාසික ගිණුම් සාරාංශ අනුව රු.36,373,077 ක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබීම නිසා රු.35,739,285 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම එදිනට තැන්පතු ගෙවීම් ශේෂ භාණ්ඩාගාර මුද්‍රිතය අනුව රු.104,665,235 ක් වුවද මාසික ගිණුම් සාරාංශ අනුව රු.36,243,705ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබීම නිසා රු.68,421,530 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සංඛ්‍යා පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කල යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් 2018 වර්ෂයේදී පැවති ශීර්ෂය යටතේම ශේෂ ඉදිරියට ගෙන ඒම නිරීක්ෂණයේ පෙන්වා ඇති ගැටළුවලට හේතු වී ඇත. කිහිපවතාවක්ම මේ සම්බන්ධව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කලද අදාළ නිවැරදි කිරීම් කර නැත. කෙසේ වෙතත් ශීර්ෂ 122 යටතේ වර්ෂය තුල සිදුකල හර හා බැර වටිනාකම් 153 ශීර්ෂයේ නිවැරදිව සටහන් වී ඇත. ඒ අනුව භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ හා අමාත්‍යාංශයේ පොත් අනුව හර හා බැර සටහන් නිවැරදිව සටහන් කර ඇත. |

**1.6.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමක් යටතේ රු.3,522,265 ක ශේෂයක් පෙන්නුම් කලද, එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව තැන්පත් විෂය සංකේත හතරක් යටතේ රු.1,496,601 ක ශේෂයක් පෙන්නුම් කෙරිණි. | සැසඳීම් කර වෙනස්කම් නිවැරදි කළ යුතු වීම. | 2017 වර්ෂයේ අමාත්‍යාංශයේ 153 ශීර්ෂය යටතේ 2018 වර්ෂයේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 122 ශීර්ෂය යටතේ ශේෂය ඉදිරියට ගෙන ඒම නිරීක්ෂණයේ පෙන්වා ඇති ගැටළුවට හේතුවයි. මේ පිළිබද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කලද නිවැරදි කර නැත. |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව ඉහත ගිණුමේ හර ශේෂය රු.55,150,394 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව හර ශේෂය රු.55,104,411 ක් විය. ඒ අනුව රු.45,983 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතුව ලෙස 2016 සිට 2018 දක්වා වර්ෂ තුන තුල හඳුනානොගත් වාරික බැර කිරීම් ලෙස ගිණුමේ දක්වා තිබුණි. එම බැරකිරීම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පොත්වල දැක්වෙන අගයන් අතර වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වීම. | වෙනස සොයා බලා නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**1.6.5 ලේඛන පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **බැරකම් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වාගත යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති රු.23,856,351 ක බැරකම්, බැරකම් ලේඛනයක ඇතුලත් කර නොතිබුණි. | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | නිරීක්ෂණයේ පෙන්වා ඇති බැරකම් වෙනත් දෙපාර්තමේන්තු වෙත පවරා දුන් ප්‍රතිපාදනවලට අදාල බැරකම් වේ. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව 2015 – 2018 වර්ෂවල සිදුවූ වාහන අනතුරු 09 කට අදාලව පරීක්ෂණ පවත්වා අලාභානි පිළිබඳ වගකිව යුතු නිලධාරීන් තීරණය කර ඊට අදාළ අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කාලය තුල පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතු වීම. | මුදල් රෙගුලාසි 104 (4) යටතේ අවසන් පරීක්ෂණය පවත්වා පරීක්ෂණ මණ්ඩල නිර්දේශය ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇත. |

**1.6.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 මැයි 03 | යාවත්කාලීන වූ චක්‍රලේඛ විධි විධාන | 1989 මාර්තු 02 චක්‍රලේඛය පරිදි ගෙවීම් කර ඇත. ඒ අනුව අදාල |

| | | |
|---|---|---|
| දිනැති ලිපිය අනුව පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලයේ යතුරු ලේඛක තනතුරක් සඳහා මාසිකව හිමි වැටුප රු.26,338 ක් ලෙස දක්වා තිබුණද, එම නිලධාරියාට 2016 වර්ෂයේ මසකට රු.86,077 ක්ද, 2017 වර්ෂයේ මසකට රු.85,987 ක්ද 2018 වර්ෂයේ සැප්තැම්බර් දක්වා මසකට රු.116,477 ක් බැගින් ද ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට යතුරු ලේඛක තනතුරට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණයට වඩා රු.2,483,933 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | අනුව වැටුප් ගෙවිය යුතු වීම. | වැටුප් අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කරන ලදී. මන්ත්‍රී කාර්ය මණ්ඩලයේ වැටුප ඒ ඒ තනතුරට වඩා වැඩි බවද මෙම ක්‍රියාවලියේ යම් අඩුපාඩුවක් වේ නම් උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි 50(11) පරිදි හැකිතාක් දුරට සම්පූර්ණවූත් නිවැරදිවූත් ඇස්තමේන්තු පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වුවද වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා වැය විෂයයන් 5 ක රු.371,076,460 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මු.රෙ. 66 මගින් මාරුකිරීම් කර තිබුණි. එසේ මාරු කිරීමෙන් පසුවද ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක් ඉතිරිව තිබුණි. එසේම මු.රෙ. 66 මගින් එක් වැය විෂයකට රු.3,750,000 ක් වෙනත් වැය විෂයකින් මාරු කිරීම් කර තිබුණු අතර එම ප්‍රමාණයෙන් සියයට 61 ක් එනම් රු.2,301,846 ක් ඉතිරි වී තිබුණි. | වියදම් පිළිබඳ නිසි අධ්‍යනයකින් පසු ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | එවැනි තත්ත්වයන් අවම කරගැනීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම් වැය විෂයය සඳහා පරිපූරක ප්‍රතිපාදන මගින් ලබාගත් රු.21,600,000 ක ප්‍රතිපාදන වැය නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | වියදම් සැලසුම් කර අවශ්‍ය ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන ලබා ගත යුතු වීම. | සියලු ප්‍රතිපාදන ප්‍රාදේශීය කාර්යාල වෙත යවා ඇතත් ඒවායේ පැවති අග්‍රිම ගැටළු හේතුවෙන් ඉතිරි වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 සැලසුම් කිරීම

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ---------------- | ---------------------------------- |
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මෙහි සියළුම ක්‍රියාකාරකම්හී අපේක්ෂිත ප්‍රතිඵල දැක්විය යුතු වුවද, අමාත්‍යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරකමක් යටතට ගැනෙන බිම්සවිය වැඩසටහනෙහි අපේක්ෂිත ප්‍රතිඵල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වීම. | 2018 වර්ෂයේ දී අමාත්‍යාංශයේ කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොමැති අතර මින් ඉදිරියට අන්තර්ගත කරන බව. |
| (ආ) | අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයට සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි බිම් සවිය වැඩ සටහන සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා ඊට අදාළ ඉලක්කයන්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණි. නමුත් එම දෙපාර්තමේන්තුව විසින් කල ඉල්ලීම් මත රු.16,820,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. | අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රතිපාදන වෙන්කල යුතුවන අතර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනය කලින් හදුනා ගැනීම සිදුකල යුතුව තිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන වෙන් නොකළ ද දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම මත මුදල් නිදහස් කරන ලදී. |
| (ඇ) | බිම්සවිය වැඩසටහන | ක්‍රියාකාරී සැලැස්ම | බිම්සවිය වැඩසටහන |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් අමාත්‍යාංශය ක්‍රියාකරන ආකාරය හෝ ක්‍රියාකාරකම් පිළිබඳව 2018 ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා නොතිබූ අතර ඒ සම්බන්ධ අමාත්‍යාංශ ප්‍රගතියද වාර්තා කර නොතිබුණි. එහෙත් අමාත්‍යාංශය විසින් බිම්සවිය වැඩසටහන යටතේ රු.2,163,965 ක් වැය කර තිබුණි. | තුල මූල්‍ය ප්‍රතිපාදනය සමග අදාල ක්‍රියාකාරකම් හා ඉලක්කයන් සඳහන් කළ යුතු වීම. | ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යකි. ඒ සඳහා අමාත්‍යාංශයේ පවතින පරිගණක පද්ධතිය භාවිතා කරන නිසා පරිගණක ජාල පද්ධතිය අලුත්වැඩියා කිරීම, බිම් සවිය අංශයේ ඉඩකඩ වෙන් කිරීම සහ හිමිකම් සහතික පත්‍ර මුද්‍රණය සඳහා වියදම් දරා ඇත. |

## 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ<br>--------------------- | නිර්දේශය<br>---------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- |
|---|---|---|
| 1950 අංක 09 දරන ඉඩම් පනතේ 38(අ) අතුරු විධාන ආඥාව පරිදි රජයේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ඉඩම් පුද්ගලික අංශයෙන් අත්පත් කර ගැනීම් ක්‍රියාවලිය ඉඩම් අමාත්‍යාංශය, සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මක කරන ආයතනය, තක්සේරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා ඊට අදාල අනෙකුත් ආයතනයන්හි සාමුහික ප්‍රතිඵලයක් වේ. ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සහ කාල වකවානු හඳුනා ගැනීමෙන් සිදුකල යුතු වුවද එවැනි වැඩ පිළිවෙලක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු නොකිරීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එසේ අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ඉදිරිපත් කර තිබූ ගොනු 8029 කින් කටයුතු නිම කිරීමට හැකි වී තිබුණේ ගොනු 1368 ක් තරම් වූ අඩු සංඛ්‍යාවකි.<br>ඒ අනුව, 1970 වර්ෂයේ සිට 2015 වසර දක්වා කාල පරිච්ඡේදය තුළ අත්පත් කරගෙන තිබූ ඉඩම් සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වන්දි පොළී | අමාත්‍යාංශයේ අත්පත් ක්‍රියාවලිය නියාමනය හා ක්‍රියාත්මක කරවන ආයතනය වන නිසා කාල නිර්ණයන් සමග නිසි ක්‍රමවේදයක් සකස් කිරීම මගින් අත්පත් කටයුතු සිදු කිරීම හා ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් ගෙවීමට කටයුතු කිරීම. | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගත වන බැවින් අත්කර ගැනීමේ ගොනුව විවෘත වන වසර තුලදීම සියළුම අත්කර ගැනීම් වන්දි ගෙවා අවසන් කිරීමේ හැකියාවක් නොමැත. |

ලෙස රු.452,708,477 ක් ගෙවීමට සිදුව තිබුණි. මීට අදාළව විගණනය විසින් කරන ලද පහත සඳහන් නියැදි පරීක්ෂණවලින් අනාවරණ වූ වන්දි ගෙවීම්, ප්‍රමාද වීම් කිහිපයක් පහත දැක්වේ.

I. ඉගිනිමිටිය ව්‍යාපාරය 1987 වර්ෂයේ සිට වර්ෂ 35 ක් ගතවී ඇතත්, වන්දි නොගෙවීම.
II. හොරණ නගර සංවර්ධන ව්‍යාපාතිය සඳහා වන්දි ගෙවීමට වර්ෂ 10 ක කාලයක් ගත වීම.
III. කළුතර ජාවත්ත බන්ධනාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන්දි ගෙවීමට වර්ෂ 12 ක් ගත වීම.
IV. ජේතවනය පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතිය 1999 වර්ෂයේ සිට වර්ෂ 16 ක් ප්‍රමාද වී වන්දි ගත වීම.